චක්‍රලේඛ අංක : 12/2023 (1)

WPCEC/MA01/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 628,
ජනජය සිටි ගොඩනැගිල්ල
8 වන මහල, නාවල පාර
රාජගිරිය
2024.04. 01

බස්නාහිර පළාතේ
සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති,
සභාපතිවරුන් වෙත.

<u>උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම</u>

උක්ත කරුණට අදාල 12/2023 චක්‍රලේඛයට පහත සඳහන් පරිදි සංශෝධන සිදු කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

( I ). "සාමාන්‍ය උපාධිය හා ඒ හා සමාන සහතික " සුදුසුකම සඳහා ලබා දෙන වැටුප් වර්ධක ගණන 02 (දෙකක්) වශයෙන් සංශෝධනය කිරීම

( ii ). චක්‍රලේඛයේ 06 වන ඡේදය " තවද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විසින් නිකුත් කරන ලද වෘත්තීය පාඨමාලා සහතික සඳහා දිරි දීමනා ගෙවීමට හැකියාව ඇති අතර, යම් සේවකයකු දැනට දිරි දීමනා ලබන තනතුරට වඩා ඉහල සුදුසුකමකට දිරි දීමනා ඉල්ලුම් කරනු ලබන්නේ නම් ඔවුන්ට එම ඉහල සුදුසුකමට අදාල මෙම චක්‍රලේඛයේ වැටුප් වර්ධක දීමනාව ගෙවිය යුතු වේ.එසේ කටයුතු කිරීමේදී එම සුදුසුකම වෙනුවට ගෙවිය යුතු එකවර දීමනා මුදල ගෙවීමේදී ඊට ප්‍රථමයෙන් ලබා ගෙන ඇති එකවර දීමනා මුදල ඉන් අඩු කර ඉතිරිය ගෙවීමට කටයුතු කල යුතු වේ " යනුවෙන් සංශෝධනය කිරීම.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි